# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/62—1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනත**

නිවාස හා ගොඩනැගිලි පිළිබඳ ඇමති පීටර් ජෙරල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථා පනතෙහි 28 (1) වන ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තා වූ ද නිවේදිත දේපොළ නොවන්නා වූ ද දේපොළ, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ කාර්යයන් සඳහා අත් කර ගැනීම මෙයින් අනුමත කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

1976. 12. 13

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් පාලක කොට්ඨාශයේ, නුවරඑළිය නාගරික ග්‍රාමසේවක කොට්ඨාශය තුළ පිහිටි ලෝසන් වීදියේ වරිපනම් අංක 2 සහ 4 සහ එලිසබෙත් රැජින වීදියේ වරිපනම් අංක 64 දරණ “නූර්ජහන්ස් ඉන්ඩස්ට්‍රීස් සහ ග්‍රයින්ඩිං මිල්ස්” නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි දළ වශයෙන් පර්චස් 38 ක පමණ ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ දේපොළ:—

උතුරට: ලෝසන් වීදියේ වරිපනම් අංක 8 සහ 12 දරණ ඉඩම්;

නැගෙනහිරට: අඹිපාර සහ නාගරික කානුව;

දකුණට: එලිසබෙත් රැජින වීදිය;

බටහිරට: ලෝසන් වීදිය.

12—98

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1 A—ඒ 24338—4,470 (76/12)